# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1513/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br><br>Date | 04/12/2023<br>පැය 0805 |

## මාධ්‍ය නිවේදනය

**01. නිවසක් බිඳ දේපල සොරකම් කරන ලද සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.12.03 වන දින දහවල් කාලයේ මීගමුව නගරයේදී සැකපිට පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී පල්ලෙවෙල පොලිස් ස්ථානය වෙත වාර්තා වී තිබූ නිවසක් බිඳ රුපියල් 696,000/- ක් වටිනා දේපල සොරකම් කිරීමක් සම්බන්ධව අවශ්‍ය කරන සැකකරු බවට අනාවරණය වී ඇත. සැකකරු සන්තකයේ තිබී රන් මුදුවක්, රන් මාල 02ක් සහ උණු කරන ලද රන් ගුලියක් සොයා ගෙන ඇති අතර සැකකරු සහ දේපල පල්ලෙවෙල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන මීරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පල්ලෙවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.12.03 වන දින උදෑසන කාලයේ මින්නේරිය පොලිස් වසමේ ගිරිතලේ ප්‍රදේශයේ දී පොළොන්නරුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ ටී 56 වර්ගයේ පතරොම් 02ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මින්නේරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන ගිරිතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මින්නේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.**

2023.12.03 වන දින දහවල් කාලයේ ගිරිබාව පොලිස් වසමේ වේරගල ප්‍රදේශයේ දී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන වේරගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගිරිබාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - උඩුගම පොලිස් ස්ථානය.**

2023.12.03 වන දින සවස් කාලයේ උඩුගම පොලිස් වසමේ අක්කර 80 ප්‍රදේශයේ දී උඩුගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන උඩුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

උඩුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**